පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය- 492

ආයතනයෙ නම - **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.**
පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 492

நிறுவனத்தின் பெயர் - **மாவட்ட செயலகம், மாத்தளை.**
பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குக் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ நிறுவனங்களிற்குப் பொறுப்பான அமைச்சரின் அவதானிப்புகள் மற்றும் எடுக்கப்படும் நடவடிக்கைகள் குறித்து பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No – 492

Name of the Institution – District Secretariat, Matale
Submission of observations of the Hon' Minister in charge of the instituions and Steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)

| කාරක සභාව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය |
|---|---|
| **01.** **ඇප ලේඛනය යාවත්කාලීන කර නොතිබීම.** | වර්තමානයේ දී ඇප ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි. |
| **02.** **සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම.** | සියලු රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත. |
| **03.** **රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබීම.** | මේ වන විට වාහන අනතුරු සම්බන්ධයෙන් වූ සියලු මු.රෙ පරීක්ෂණ කටයුතු අවසන් කර අදාල අයවීම් ද අයකරගෙන ඇත. |
| **04.** **වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.** | විශ්‍රාම ලැබූ නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ නිරවුල් කර ඇති අතර, වැඩ තහනම් වූ නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ අය වෙමින් පවතී. සේවය අතහැරගොස් ඇති එක් නිලධාරියකුගේ ණය ශේෂය රා.මු.ච.01/2024ට අනුව පොතෙන් කපාහැර ඇති අතර, අනෙක් නිලධාරියාගේ ණය ශේෂය අයවෙමින් පවතී. |
| **05.** **පොදු තැන්පතු ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබීම.** | පොදු තැන්පත් ගිණුමේ ඇති වසර 2 ඉක්මවූ රැඳවුම් මේ වන විට ගෙවා අවසන් කර ඇත. |
| **06.** **වෙනත් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් අය කළ ආදායම් නියමිත කාලය තුළ අදාල ආයතන වෙත යවා නොතිබීම.** | රැස්කරනු ලබන වෙනත් ගණන්දීමේ නිලධාරීන්ගේ ආදායම් නිශ්චිත කාලවකවානු තුළදීම අදාළ ආයතන වෙත යැවීම සිදුකරනු ලබයි. වර්තමානයේ එවැනි ප්‍රමාදයන් නොමැත. |
| **07.** **මාසික දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පවත්වා නොතිබීම.** | 2023 වර්ෂයේදී ජනවාරි හා මාර්තු මාසවල එවකට රටේ පැවති ආර්ථික අර්බුදකාරි තත්වය හේතුවෙන්ද, ජූලි හා සැප්තැම්බර් මාස වල පිළිවෙලින් සාකච්ඡා කිරීමට කරුණු නොමැති වීම හා සම්බන්ධීකරණ කමිටු සභාපති හට කාර්ය බහුලත්වය නිසා රැස්වීම පැවැත්වීමට දිනයක් යොදා ගැනීමට නොහැකි වීම හේතුවෙන් නොපැවැත්වූ අතර, 2023 දෙසැම්බර් මස ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පවත්වා ඇත.<br><br>2024 වර්ෂයේදී මාර්තු,අප්‍රේල් හා මැයි යන මාසවල විධායක නිලධාරීන්ගේ වැඩවර්ජන හේතුවෙන් රැස්වීම් පැවැත්වීමට නොහැකිවි ඇති අතර, අගොස්තු මාසය දක්වා මසකට වරක් බැගින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පවත්වා ඇත.සැප්තැම්බර්,ඔක්තෝබර් හා නොවැම්බර් මාස වල ජනාධිපත්වරණය හා පාර්ලිමේන්තු මැතිවරණය හේතුවෙන් කමිටු පවත්වා නොමැති අතර, 2025 වර්ෂය තුළ 8 වරක්ද 2026 වර්ෂය තුළ 02වරක්ද කමිටු පවත්වා ඇත. |

| | |
|---|---|
| **08. දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබීම.** | 2023 වර්ෂයේ උද්ගතව පැවති අතිශය සීමාකාරී වූ මූල්‍ය අවකාශය තුළ රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022, 08/2022, 09/2022 හා ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද , PS/SB/Circular/10/2022 හා 2022.08.15 වන දිනැති චක්‍රලේඛ උපදෙස් අනුව රාජ්‍ය ආයතන විසින් අත්‍යවශ්‍යයන්ම පැවැත්විය යුතු රැස්වීම් සහ වැඩමුළු පමණක් පැවැත්විය යුතු බවට දැඩිව අවධාරණය කර තිබූ අතර, මේ හේතුවෙන් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සමුළු නොපැවැත් වූ අතර, බොහෝවිට ඊ-මේල් පනිවිඩ , Whatsapp හා zoom තාක්ෂණය ඔස්සේ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමේ කටයුතු වියදම් දැරීමකින් තොරව සිදු කළ අතර, අත්‍යවශ්‍යම රාජකාරි වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැත්වෙන රැස්වීම් වලදී බොහෝවිට මෙම නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරනු ලැබුණි. |
| **09. දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස්වී නොතිබීම.** | ප්‍රතිපාදන වෙන්වීම මත ක්‍රියාත්මක වන වැඩසටහන් අනුව හා සාකච්ඡා කිරීමට ඇති ප්‍රමාණවත් කරුණු හේතුවෙන් පමණක් මෙම රැස්වීම් පවත්වනු ලබයි. 2023 වර්ෂයේ ජූනි හා ඔක්තෝබර් මාස වල කමිටු පවත්වා ඇති අතර, 2025 වර්ෂයේ කමිටු වාර 04 ක් පවත්වා ඇත. |
| **10. දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්වී නොතිබීම.** | ප්‍රධාන වගා කන්න දෙකේදී පමණක් පොහොර සම්බන්ධීකරණ කමිටු පවත්වනු ලබයි. |
| **11. දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටුව මාසිකව රැස්වී නොතිබීම.** | මාසිකව මිළ නියම කිරීමේ කමිටු නොපවත්වන අතර, වර්ෂයේ මුල් භාගයේ සහ අගභාගයේ ( වර්ෂයකට දෙවරක්) පමණක් පවත්වනු ලබයි. නමුත් වෙළඳපලේ අසාමාන්‍ය මිල විචලනයන් ඇතිවන අවස්ථාවන්හි දී විශේෂ මිල නියම කිරීමේ කමිටු පවත්වයි. |
| **12. පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.** | පුරවැසි/සේවාලාභී අදහස් හා පැමිණිලි සටහන් කිරීමට පහසුකම් සපයා ඇති අතර, ඒ පිළිබඳ අධීක්ෂණය කිරීමට මාණ්ඩලික නිලධාරියකු පත් කර ඇත. |
| **13. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50% වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කටය නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබීම.** | වර්ෂය තුළ ලැබෙන ප්‍රතිපාදන අනුව උපරිම ලෙස ධාරිතා සංවර්ධනය සඳහා නිලධාරි පුහුණුවීම් පවත්වනු ලබයි. |
| **14. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස්කර ගිවිසුම් ගතව නොතිබීම.** | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 අනුව 2023 වර්ෂයේ කාර්යය මණ්ඩලයේ සියලුම නිලධාරීන් වෙනුවෙන් කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගත වී ඇත. |

| | |
|---|---|
| **15.** දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වී නොත්බීම. | ප්‍රතිපාදන වෙන්වීම මත දෙවන හා තුන්වන කාර්තු වල දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව පවත්වා ඇත. |
| **16.** සැලසුම් ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවතීම. | 2024 වර්ෂයේ නිලධාරීන් 1938න් 1025 ක් සඳහා ද 2025 වර්ෂයේ නිලධාරීන් 1910 න් 1475 ක් සඳහාද පුහුණු අවස්ථා ලබා දී ඇත. |
| **17.** දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 2කට වරක් රැස්වී නොතිබීම. | කමිටු වෙත ඉදිරිපත් කරනු ලබන ලිපි අනුව මෙම රැස්වීම් කටයුතු සිදුකරනු ලබන අතර, අත්‍යාවශ්‍යයෙන්ම සාකච්ඡා කළයුතු කරුණු පවත්නා අවස්ථා වලදී මේ සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් රැස්වීම් පවත්වනු ලබයි. |

එල්.පී.මදනායක,
දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.

එල්.පී. මදනායක
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මාතලේ

එම්.ඒ.පී.මිලජිත්,
ප්‍රධාන ගණකාධිකාරි,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.

එම්.ඒ. ප්‍රියංග මිලජිත්
ප්‍රධාන ගණකාධිකාරි
මාතලේ දිස්ත්‍රික් ලේකම්
වෙනුවට

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරස්‍රය - කොළඹ 07.